# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>2171635<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 2021/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 25/07/2024<br>පැය 0530 | | |

## මාධ්‍ය නිවේදනය

### 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර අතුරුගිරිය.

2024.07.24 වන දින රාත්‍රී කාලයේ වත්තල පොලිස් වසමේ වත්තල ඇවරියවත්ත මාර්ගයේදී අතුරුගිරිය පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 513 මිලිග්‍රෑම් 920 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන වත්තල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන ගෝනවල, කැලණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. හෙරොයින් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය.

2024.07.24 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ කටුකුරුඳුවත්ත මාර්ගය අසලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. හෙරොයින් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණු අපරාධ කොට්ඨාසය.

2024.07.24 වන දින සවස් කාලයේ මොරටුව පොලිස් වසමේ ලුනාව ප්‍රදේශයේදී බස්නාහිර පළාත් දකුණු අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන මොරටුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන ලුනාව, මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.

2024.07.24 වන දින රාත්‍රී කාලයේ මොරටුව පොලිස් වසමේ මුරවත්ත ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වන පරණ කඩේ, බේරුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2024.07.24 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ සොයිසාපුර ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 170 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 60 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - හොරණ පොලිස් ස්ථානය.

2024.07.24 වන දින රාත්‍රී කාලයේ හොරණ පොලිස් වසමේ බැල්ලපිටිය ප්‍රදේශයේදී හොරණ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 52 මිලි ලීටර් 500 සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන හොරණ, බැල්ලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හොරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - හැටන් පොලිස් ස්ථානය.

2024.07.24 වන දින සවස් කාලයේ හැටන් පොලිස් වසමේ දික්ඔය ප්‍රදේශයේදී හැටන් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක්

සිදුකර බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 40, 45 හා 54 යන වයස්වල පසුවන දික්ඔය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

හැටන් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. සැකකටයුතු මරණයක් - ඉලවාලි පොලිස් වසම

2024.07.24 වන දින උදෑසන කාලයේ ඉලවාලි පොලිස් වසමේ පණ්ඩතිරිප්පු ප්‍රදේශයේ නිවසක පුද්ගලයෙකු මියගොස් ඇති බවට ඉලවාලි පොලිසියට ලද තොරතුරක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 74 ක් වූ සෙට්ටිකුරිච්චි, පණ්ඩතිරිප්පු ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

අසල්වාසියෙකු විසින් මරණකරුගේ නිවස දෙසින් දැඩි දුඟඳක් දැනීම හේතුවෙන් පරීක්ෂා කිරීමේදී මෘත දේහය එම නිවසෙහි ඉදිරිපිට කොරිඩෝවෙහි තිබී දැකීමෙන් පසු පොලිසිය දැනුවත් කර ඇත. මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත.

මෘත දේහය සම්බන්යෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඉලවාලි පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**